(03)

00502

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - සිව්වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2017/18
**LLU4707/LWU2313** – පවුල් නීතිය
කාලය පැය (03) තුනයි

---

දිනය ඃ 2020 මාර්තු 01 වේලාවඃ පෙ.ව. 9.30 - ප.ව. 12.30

---

මුළු ප්‍රශ්න ගණන 08 යි.

අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

ප්‍රශ්න (05) පහකට පමණක් පිළිතුරු සපයන්න.

**ඔබ විසින් තෝරා ගනු ලබන ප්‍රශ්නවලට අදාළ පිළිතුරු විනිශ්චිත නඩුතීරණ සහ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරින් ඉදිරිපත් කළ යුතුය.**

**01.** ක්‍රිෂ්නි සහ සංඛ සාමාන්‍ය නීතිය යටතේ 2016 දී විවාහ වූහ. විවාහයෙන් තෙමසකට පසු ඔවහු එංගලන්තයේ පදිංචියට ගියහ. ක්‍රිෂ්නි ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු සොයා බලන්නට 2018 ජනවාරි මස ලංකාවට පැමිණියාය. ක්‍රිෂ්නි ශ්‍රී ලංකාවේ සිටින අතරතුර 2018 පෙබරවාරියේදී අසනීප වූ අතර එහිදී ඇය තෙමස් ගැබිනියක් බව දැන ගැනීමට ලැබුණි.

මේ පිළිබඳ කමල්ට දැනුම්දුන් පසු ඉන් සතුටට පත් කමල් රැකියා ස්ථානයෙන් නිවාඩු ලබා ගත් වහාම 2018 මැයි පමණ වන විට ලංකාවට පැමිණෙන බව පොරොන්දු විය. දරුවා බිහිවන තුරු ඇයගේ දෙමාපියන් සමඟ ලංකාවේ සිටින ලෙස ඔහු ඇයට අවවාද කළේය. කෙසේ වෙතත් ඔහු මැයි මසදී ලංකාවට නොපැමිණි අතර ඔහුට නිවාඩු ලබා ගැනීමේ අපහසුතාවක් පවතින බව පැවසීය. ක්‍රිෂ්නි 2018 අගෝස්තු මස පිරිමි දරුවකු බිහි කළාය. සිය කුළුඳුල් දරුවා බිහිවන අවස්ථාවේ සංඛ ලංකාවේ නොසිටීම පිළිබඳ ක්‍රිෂ්නි මෙන්ම ඇයගේ දෙමව්පියන්ද සංඛට නොසතුට පළ කළහ. ඔහු විවිධ හේතු දක්වමින් ඔහුගේ පැමිණීම ප්‍රමාද කළේය.

සංඛ එංගලන්තයේම වෙසෙන අනෝමා නම් කාන්තාවක සමඟ ප්‍රේම සබඳතාවයක් පවත් වන බව ක්‍රිෂ්නි ට ඇයගේ මිතුරියකගේ මාර්ගයෙන් දැන ගැනීමට ලැබුණි. පසුව 2019 මැයි

මස ලංකාවට පැමිණි ඔහු දරුවාගේ පීතෘත්වය ප්‍රතික්ෂේප කළේය. සංඛ ලංකාවේ සිටින කාලය තුළ ඔහුගේ දෙමව්පියන්ගේ නිවසේ වාසය කළේය.

දරුවාගේ සුජාතභාවය තහවුරු කිරීම සම්බන්ධයෙන් ක්‍රිෂ්නිට ගත හැකි නෛතික ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න. (ලකුණු 20)

**02.** "...ශ්‍රී ලංකාව වැනි බහු ජාතික රටක චාරිත්‍රානුකූල විවාහයකදී වලංගු චාරිත්‍ර වතාවත් පවත්වා ඇත්තේද යන්න තීරණය කිරීමේදී අධිකරණයක් විවිධ දුෂ්කරතාවන්ට මුහුණදෙයි. එයට හේතුව වන්නේ විවිධ ජනසමූහයා විවාහ මංගල්‍යවලදී විවධ චාරිත්‍ර අනුගමනය කිරීමයි. එසේම එකම ජන වර්ගය තුළ පවා විවිධ චාරිත්‍ර වතාවත් තිබිය හැකිය. එහෙයින් වලංගු චාරිත්‍රානුකූල විවාහයක අත්‍යවශ්‍ය ලක්ෂණ තීරණය කිරීමේ දුෂ්කරතාවක් පවතී..."

*පවුල් නීතිය, පිඩුව I, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, 18 පිටුව*

සාමාන්‍ය නීතිය, උඩරට නීතිය හා මුස්ලිම් නීතිය යටතේ වලංගු චාරිත්‍රානුකූල විවාහයක අත්‍යවශ්‍ය ලක්ෂණ සාකච්ඡා කරන්න. (ලකුණු 20)

**03.** රවීන්ද්‍ර සහ ජයනි 1985 දී සාමාන්‍ය නීතිය යටතේ විවාහ වූහ. ඔවුනට කුෂාන් හා තරිඳි නම් දැරුවන් දෙදෙනෙකු සිටියි. තරිඳි මනෝහරන් නම් ද්‍රවිඩ ජාතිකයකු සමඟ ප්‍රේම සබඳතාවයක් පැවැත් වීය. එම සම්බන්ධයට රවීන්ද්‍ර විරුද්ධ වූ නමුත් තරිඳි මනෝහරන් සමඟ 2017 විවාහ වූවාය.

2018 වසරේදී රවීන්ද්‍ර සිය අන්තිම කැමති පත්‍රය ඔහුගේ මිතුරන් පස් දෙනෙකු ඉදිරියේ සකස් කොට අත්සන් තැබීය. 2019 මැයි මස රවීන්ද්‍ර මිය ගියේය. අන්තිම කැමති පත්‍රය අනුව පහත පරිදි ඔහුගේ දේපළ බෙදා දී තිබුණි.

- නුවර එළියේ පිහිටි අක්කර 20ක තේවත්ත - ඔහුගේ පුතු කුෂාන්ට
- කොළඹ පිහිටි නිවස - ඔහුගේ බිරිඳ ජයනි ට
- මහරගම පිහිටි අක්කර 2ක ඉඩම - ඔහුගේ මිතුරෙකු වූ ලිලාන් ට

දේපළ අනුප්‍රාප්තිය සම්බන්ධයෙන් පහත ප්‍රශ්න සාකච්ඡා කරන්න

**i.** තරිඳි සිය පියා විසින් ලියන ලද අන්තිම කැමති පත්‍රයේ වලංගුතාවය අභියෝගයට ලක් කරයි. (ලකුණු 07)

**ii.** රවීන්ද්‍ර මිය ගියේ අන්තිම කැමති පත්‍රයක් රහිතව නම් දේපළ බෙදී යන්නේ කෙසේද? (ලකුණු 07)

**iii.** පාර්ශවයන් තේසවලමෙයි නීතියෙන් පාලනය වූයේනම්; නුවර එළියේ පිහිටි අක්කර 20 ක තේ වත්ත 1995 දී රවීන්ද්‍ර මිලට ගත්තේනම් සහ රවීන්ද්‍ර අන්තිම කැමති පත්‍රයක් නොමැතිව මිය ගියේ නම් ඔබේ පිළිතුර කෙසේ වෙනස් වන්නේද? (ලකුණු 06)

**04.** 'වෛවාහක වැරැද්දට' වඩා විවාහය කඩාකප්පල් වීම දික්කසාදයට තර්කානුකූල පදනම වේ.'

ඉහත ප්‍රකාශය ඇසුරින් දික්කසාද නීතිය ප්‍රතිසංස්කරණය කිරීමේ ශ්‍රී ලංකා ප්‍රතිචාරය සාකච්ඡා කරන්න. (ලකුණු 20)

**05.** පහත අවස්ථාවන්හි පාර්ශවයන්ගේ නෛතික තත්ත්වය සාකච්ඡා කරන්න.

**i.** චන්ද්‍රන් සහ මේධාවි 2011 දී විවාහ විය. නීලා ඔවුන්ගේ එකම දියණිය වේ. චන්ද්‍රන් කලින් විවාහකයකු බවත් ඔහුට දාව තවත් දියණියන් දෙනෙක් සිටින බවත් මේධාවි ට පසුව දැනගන්නට ලැබේ. (ලකුණු 07)

**ii.** සුපිපි සහ ගයාන්ගේ විවාහ දිවියට වසර 15ක් සපිරුණද ඔවුන් දෙදෙනාට දරුවන් නොමැත. දරුවකු දරුකමට හදා ගැනීමට සුපිපිට අවශ්‍ය වුවද ගයාන් එයට අකමැති බවද ඇය දනී. අසළ ගමක සිටින අවුරුදු 11ක් වයසැති නීලකගේ දෙමාපියන් ඔවුන්ගේ දරුවා සුපිපි සහ ගයාන්ට දරුකමට හදා ගැනීමට සඳහා දීමට කැමැත්තෙන් සිටී. සුපිපි දරුවා දරුකමට හදා ගැනීමට එකඟ වූ අතර නීලකගේ දෙමාපියන්ද එයට එකඟ වේ. කෙසේ වෙතත් නීලක දෙමව්පියන් හැර යාම ප්‍රතික්ෂේප කරයි. (ලකුණු 07)

**iii.** මහනුවර වාසය කරන පරාක්‍රමට වයස අවුරුදු 18 කි. ඔහු පේරාදෙණියේ පදිංචි වයස අවුරුදු 16ක් වන ධරණි සමඟ උඩරට නීතිය යටතේ විවාහ විය. විවාහයෙන් වසරකට පසු ධරණි පිරිමි දරුවකු බිහි කළාය. (ලකුණු 06)

**06. (i)** බැංකු ක්ෂේත්‍රයේ රැකියාවන්හි නිරත එරන්ද හා චලනි සාමාන්‍ය නීතිය යටතේ විවාහ වූ යුවලකි. විවාහයෙන් පසු ඔවුන් දෙදෙනා මාතර කුලී නිවාසයක ජීවත් විය. විවාහයෙන් වසරකට පසු චලනී නිවුන් දරුවන් බිහි කළ අතර ඔවුන් අකිල හා විපුල වේ. දරුවන් රැක බලා ගැනීමේ අපහසුතාව හේතුවෙන් චලනී රැකියාවෙන් ඉවත් වූ අතර එරන්ද ට සහකාර කළමනාකරුවකු වශයෙන් උසස්වීමක් ලැබුණි. කාලයක්යත්ම එරන්ද, චලනි සහ දරුවන් පිළිබඳ සොයා බැලීම අඩු වූ අතර ඒ පිළිබඳ චලනි ඔහුගෙන් ප්‍රශ්න කළ විට එරන්ද පැවසුවේ බැංකුවේ වැඩ අධික බවකි. මේ අතර එරන්ද පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා සෑම සති අන්තයකදීම කොළඹට යාමට පටන් ගත්තේය. එරන්ද නිවසේ අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් මුදලක් නොසැපයූ බැවින් චලනී සහ දරුවන් බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දුන්හ.

මේ අතර කොළඹ සිටින චලනීගේ ඥාතියෙකු, එරන්ද කොළඹ කාන්තාවක් සමඟ සමීප ඇසුරක් පවත්වන බව චලනීට දැනුම් දුන්නේය. චලනී මේ පිළිබඳ සිය දෙමාපියන්ට දැන්වූ අතර චලනීගේ දෙමාපියන් එරන්දගෙන් මේ පිළිබඳ ප්‍රශ්න කළ විට ඉන් දැඩි කෝපයට පත් එරන්ද, චලනීට වහාම දරුවන් රැගෙන නිවසින් පිටවන ලෙස නියෝග කළේය. මෙම සිදුවීමෙන් සතියකට පසු එරන්ද කොළඹට මාරුවක් ලබා ගත් අතර චලනි සහ දරුවන් නඩත්තු කිරීම නතර කළේය.

දරුවන් දෙදෙනා සහ තමන්ට එරන්දගෙන් නඩත්තු ලබා ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් චලනි ඔබෙන් උපදෙස් පතයි. චලනීට උපදෙස් දෙන්න. (ලකුණු 15)

**(ii)** පාර්ශවයන් මුස්ලිම් නීතියෙන් පාලනය වූයේ නම් ඔබේ පිළිතුර වෙනස් වන්නේද? පැහැදිලි කරන්න. (ලකුණු 05)

**07.** ළමුන් සම්බන්ධ සියලු කාරණා වලදී, රාජ්‍ය හෝ පෞද්ගලික සමාජ සුභසාධන ආයතන, අධිකරණ, පරිපාලන අධිකාරීන් හෝ ව්‍යවස්ථාදායක මණ්ඩල දරුවාගේ උපරිම යහපත මූලික වශයෙන් සළකා බැලිය යුතුය.

– *3(1) ව්‍යවස්ථාව, ළමා අයිතිවාසිකම් සම්මුතිය*

ඉහත ප්‍රකාශය සැළකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ දරුවන්ගේ උපරිම යහපත සහතික කිරීම වෙනුවෙන් ගත් ව්‍යවස්ථාදායක සහ අධිකරණමය උත්සහයන් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

**08.** පහත නඩු තීරණයන්ගේ නෛතික වැදගත්කම පැහැදිලි කරමින් සටහන් ලියන්න.

i. *අම්බලවානර් එ. නවරත්නම්* (1955) 56 N.L.R.422
ii. *ජෙයරාජන් එ. ජෙයරාජන්* (1999) 1 Sri L.R. 113
iii. *අබේසුන්දර එ. අබේසුන්දර* (1998) 1 Sri L.R. 185
iv. *ජයසිංහ එ. කිරිබිංදු* (1997) 2 Sri L.R. 1
v. *ගවුස් එ. ගවුස්* (1988) 1Sri L.R. 25

(ලකුණු 04 x 5 = 20)

**** *නිමිකම් ඇවිරිණි* ****